www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානාපොලිස් නගරයේ මෝටර් කම්කරුවෝ නිර්භීත පියවරක් ගනිති

**Indianapolis auto workers take a courageous stand**

**පැට්‍රික් මාටින් විසිනි**

**2010 අගෝස්තු 18**

ඉන්දියානාපොලිස්හි ජෙනරල් මෝටර්ස් සමාගමේ මුද්‍රා අංශයේ කම්කරුවන් ඔවුන්ගේ වැටුප් හරි අඩකින් කපා දැමීම සඳහා කොම්පැනිය ද යුනයිටඩ් මෝටර්ස් (යූඒඩබ්ලිව්) වෘත්තීය සමිතිය ද එක්ව ක්‍රියාත්මක කල සැලැස්මට විරුද්ධව නිර්භීත ආස්ථානයක් ගෙන ඇත. 15 වැනි ඉරිදා පවත්වන ලද රැස්වීමක දී යූඒඩබ්ලිව් සමිතියේ නිලධාරින්ගේ කථාවලට හඬනගා විරුද්ධත්වය දැක්වූ සාමාන්‍ය කම්කරුවෝ ඩිට්‍රොයිට්හි යූඒඩබ්ලිව් සමිතියෙන් පැමිනි නිලධාරීන් එලවාදැමූහ.

ලොකු පඩි කන වෘත්තිය සමිති නිලධාරින් කෙරේ කම්කරුවන් සහජාසයෙන් මෙන් දැක්වූ විරුද්ධත්වය පෙන්නුම් කරන්නේ සෞඛ්‍ය සම්පන්න පන්ති ඉවකි. මහ කොම්පැනි විසින් නියම කරන වැටුප් සහ රැකියා කැපීම පිලිගන්නට කම්කරුවන්ට බලකිරීම මගින් ඉලක්කම් හයේ පඩි තමන්ට ලබාගන්නා මෙම නිලධාරින් සමග තමන්ට කිසිදු පොදු අවශ්‍යතාවයක් ඇත්තේ නැතැයි යන්න මෙම ෆැක්ටරි කම්කරුවන් වටහාගෙන තිබේ.

කම්කරුවන්ගේ වැටුප පැයකට ඇමරිකන් ඩොලර් 29ක සිට ඇමරිකන් ඩොලර් 15.50 දක්වා කැපීම සාමාන්‍ය කම්කරුවන් ලවා පිලිගන්වන්නට දැරෙන ප්‍රයත්නය අඟහරුවාදා *ඉන්දියානාපොලිස් ස්ටාර්* පුවත්පතේ සම්පූර්න පිටුවක පලකරන ලද දැන්වීමක් මගින් ඉදිරියට ගෙන යන ලදී. එම දැන්වීම පලකරන ලද්දේ ජෙනරල් මෝටර්ස් සමාගමෙන් මුද්‍රා අංශය මිලදී ගෙන එය අඩු වැටුප් සහිත දාඩිය කම්මලක් බවට පත් කිරීමට වැඩ කරගෙන යන ජේඩී නෝමන් සමාගම විසිනි.

කලින් කොටස් ජාවාරම්කරුවකුව සිට දැන් මෝටර් කර්මාන්තයේ පරපුට්ටකු බවට පරිවර්තනය වී සිටින 34 හැවිරිදි ජස්ටින් ඩී නෝමන් නමැති, මෙම අලුත් කොම්පැනියේ අයිතිකරු සහ යූඒඩබ්ලිව් වෘත්තීය සමිතියේ රීජන්-3 ප්‍රාදේශිකයේ අධ්‍යක්ෂ මොරිස් ඩේවිසන් ද යන දෙදෙනාම ඉදිරිපත් කරන්නේ එකම තර්කයකි. ඔවුන් කියා සිටින්නේ ගිවිසුම ප්‍රතික්ෂේපකල රැස්වීමට පැමිනි කම්කරුවන් සංඛ්‍යාව මෙම වැඩපලේ කම්කරුවන්ගෙන් බහුතරයක් නියෝජනය නොකල බවයි.

එම පුවත්පත් දැන්වීම මෙසේ කියයි. "සෝෂාකාරී විරුද්ධවාදීන් අතලොස්සක් පමනක් මෙම යෝධ කර්මාන්ත ශාලාවේ ඉරනම තීන්දු කල යුතු යයි මම නොසිතමි." මෙම හැඟීම ම ප්‍රතිරාවය කල ඩේවිසන් *ස්ටාර්* පුවත්පතට මෙසේ ප්‍රකාශ කලේ ය. "එම වැඩපලේ 600ක්දෙනා වැඩ කරති. ඒත් එදා විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට පැමිනියේ 200ක් පමනි. මා සිතන්නේ එම රැස්වීමට නොපැමිනි ඉතුරු 400 ගැනය."

එහෙත් කොම්පැනිකාරයාවත් වෘත්තීය සමිති නිලධාරියාවත් සඳහන් නොකරන දෙයක් ඇත. එනම් කලින් මැයි 26 දා ගන්නා ලද ඡන්දයක දී සාමාන්‍ය කම්කරුවන්ගෙන් අතිමහත් බහුතරයක් - 384 ට 22 වශයෙන් - ජේඩී නෝමන් සමග මොනම සාකච්ඡාවක් හෝ පැවැත්වීම ප්‍රතික්ෂේප කල බවය. එම පැහැදිලි ප්‍රජාතන්ත්‍ර තීන්දුව පෙරලාදැමීමට උත්සාහ කරන යූඒඩබ්ලිව් සමිතිය කම්කරුවන්ගේ කැමැත්තට පිටින් වැටුප් කැපීමේ තීන්දුව ඔවුන් පිට පැටවීමට යත්න දරයි. වෘත්තීය සමිතිය ක්‍රියාකරන්නේ ජෙනරල් මෝටර්ස් සහ ජේඩී නෝමන් සමාගම්වල සම්පූර්න හවුල්කරුවකු ලෙස ය.

තමන්ගේ රැකියා සහ ජීවන් තත්වයන් ට එරෙහි මෙම කුමන්ත්‍රනයට ඉන්දියානාපොලිස් කම්කරුවන් දී ඇත්තේ දරුනු පහරකි. එහෙත් 15 වෙනි ඉරිදා තීන්දුව වනාහී පලමුවන පියවර පමනි. ඉන්දියානාපොලිස් නගරයේ ද එම ප්‍රාන්තයේ ද මුලු රටේම ද වැඩ කරන ජනතාවගේ සහාය මෙම කම්කරුවන් වටා බලමුලුගන්වා ගතයුතු ය. එසේ නැතහොත් මෙම අරගලය තනි කොට කලින් මෙවන් අරගල විශාල සංඛ්‍යාවක් පරිද්දෙන්ම පරාජයට පත් කෙරෙනු ඇත.

එවන් අරගලයක් සාර්ථක කරගැනීමට නම් කම්කරුවන් විසින් අන්සියල්ලටමත් පෙර වටහා ගතයුතුව ඇත්තේ යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය

පාලකයින්ගේ අතකොලුවක් බවය. යූඒඩබ්ලිව් සමිතිය වශයෙන් කම්කරුවන් මුහුන දී සිටින්නේ කොම්පැනි ලොක්කන් ද මහා ජාවාරම්වල දේශපාලකයන් තරම්ම දුෂ්ට වූ සතුරෙකුට ය.

යූඒඩබ්ලිව් සමිතියේ පරිහානිය දීර්ඝ ක්‍රියාවලියකි. දැන් එය පාලකයින්ගේ උපකරනයක් ලෙස මුලුමනින්ම පරිවර්තනය වී තිබේ. මෝරිස් ඩෝසන් වැනි වෘත්තීය සමිති නිලධාරින් ද ජාත්‍යන්තර සේවා නියෝජිතයන් සහ ප්‍රාදේශීය අධ්‍යක්ෂවරුන් ද ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වෙනත් කොම්පැනි ඒජන්තයින් ද යන සම්පූර්න නඩයම සාමාන්‍ය කම්කරුවන්ගේ අවශ්‍යතාවන්වලට මුලුමනින්ම පටහැනි වූ ආර්ථික උවමනාකම් නියෝජනය කරති. 2001-2008 දක්වා කාල පරිච්ඡේදය තුල පමනක් ගත්තත් යූඒඩබ්ලිව් සාමාජිකත්වය 701,000 සිට 431,000 දක්වා පහත වැටුනි. මෙය සියයට 40ක පිරිහීමකි. ඒත් වෘත්තීය සංගමයේ ආදායම නම් ඩොලර් මිලියන 1,100 සිට ඩොලර් මිලියන 1,200 දක්වා ඉහල නැගුනි.

ජීඑම් සහ ක්‍රයිස්ලර් සමාගම් බංකොලොත් වූකල ඒවා සමග ඇතිකරගත් ගිවිසුමට අනුව යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය සමාගම් දෙකේම විශාල කොටස්කරුවෙකු බවට පත්විය. වීබා (VEBA) නම් මෙම ගිවිසුමට අනුව වැටුප් කැපීම් සහ කොම්පැනි වල කොටස් වටිනාකම් ඉහල දැමීම සඳහා තෑග්ගක් වශයෙන් වෘත්තීය සමිති නිලධාරින්ට සෘජු මූල්‍යමය දිරිගැන්වීම් ප්‍රදානය කරන ලදී. මෙම පොදියට හුවමාරු වශයෙන් යූඒඩබ්ලිව් සමිතිය කොම්පැනිය විසින් අලුතෙන් සේවයට ගන්නා කම්කරුවන්ගේ වැටුප සියයට 50කින් කැපීමට ද තමන්ගේම සාමාජිකයින් මහ කොම්පැනිවල අඩු වැටුප් සේවකයන් ලෙස විකුනා දැමීමට ද එකඟ විය.

ඉන්දියානාපොලිස් කම්කරුවන්ගේ කැරැල්ල එන්නේ මෝටර් රථ කම්කරුවන් ද යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය ද අතර ගැටුම් මාලාවකින් අලුත්ම එක ලෙස ය. 2009 නොවැම්බර්-දෙසැම්බර් මාසවල දී ෆෝර්ඩ් රවුජ් කර්මාන්තශාලාවේ කම්කරුවන්ගේ රැස්වීමක දී දැන් යූඒඩබ්ලිව් සභාපතිව සිටින බොබ් කිංග් ගේ කථාව ගෝසාකරමින් වලක්වා ලූ කම්කරුවෝ ෆෝර්ඩ් කොන්ත්‍රාත්තුව ප්‍රතික්ෂේප කලහ; කැලිෆෝනියාවේ ෆ්‍රීමොන්ට්හි ජීඑම්/ ටොයොටා කර්මාන්තශාලාවේ රැස්වීමක දී නැගී සිටි කම්කරුවෝ ප්‍රාදේශීය වෘත්තීය සමිති නිලධාරින්ට හූ කියා එලවා දැමූහ; මහා වැටුප් කැපීමක් ප්‍රතික්ෂේප කල සැගිනෝ මෝටර් රථ කොටස් කර්මාන්තශාලාවේ කම්කරුවන් මත ඊට මසකට පසු පවත්වනු ලැබූ දෙවන ඡන්දයක් මගින් යෝධ වැටුප් කැපීමක් ජුලි මාසයේ දී පටවන ලදී.

ඉන්දියානාපොලිස් මුද්‍රා අංශයේ කම්කරුවන් යූඒඩබ්ලිව් වෘත්තීය සමිතියේ දඬු අඬුවෙන් ගැලවී එහි ලෝකල් 23 ශාඛාවෙන් ද රීජන්-3 ප්‍රාදේශීය ශාඛාවෙන් ද සොලිඩැරිටි හවුස් නමැති සමිති මූලස්ථානයෙන් ද ස්වාධීනව සාමාන්‍ය සමාජිකයන්ගේ ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා ගත යුතු ය. මෙවන් කමිටුවක් පිහිටුවීම රැකියා ආරක්ෂා කරගැනීමේ සම්මුති විරහිත අරගලයක් සඳහා අත්‍යවශ්‍යවේ.

මුද්‍රා කර්මාන්ත ශාලාවේ කම්කරුවන් ෆැක්ටරිය අත්පත් කරගෙන ජෙනරල් මෝටර්ස් සමාගම විසින් එය වසාලීම හෝ ජේඩී නෝමන් සමාගම විසින් එය අයිති කරගැනීම වැලැක්විය යුතුය. තමන්ට සහාය දෙන ලෙස මිඩ්වෙස්ට් ප්‍රදේශවල සහ මුලුරට පුරාම ජෙනරල් මෝටර්ස්, ෆෝර්ඩ්, ක්‍රයිස්ලර්, සහ ඒවාට කොටස් සපයන වෙනත් කර්මාන්තශාලාවල කම්කරුවන්ගෙන් ඉල්ලා සිටිය යුතුය. මෙවන් ප්‍රහාරවලට මුහුන දී සිටින සෙසු රටවල කම්කරුවන්ගේ සහාය ද ඉල්ලා සිටිය යුතුය. ඉන්දියානාපොලිස් කම්කරුවන් විසින් කෙරෙන එවන් ආයාචනයක් දැවැන්ත උනන්දුවක් අවධානයක් සහ සහයෝගයක් ලබාගනු ඇත.

2008 දෙසැම්බර් මාසයේ චිකාගෝ නුවර රිපබ්ලික් වින්ඩෝස් ඇන්ඩ් ඩෝස් කර්මාන්ත ශාලාවේ කම්කරුවන්ට රැකියා හැරයාමේ වන්දියක් ගෙවීමට දී තිබුනු පොරොන්දුව කොම්පැනි හිමියන් විසින් බිඳීමට දැරූ ප්‍රයත්නයට එරෙහිව කම්කරුවන්, දින 5ක් තිස්සේ කර්මාන්තශාලාව අල්ලා ගත් කල්හි රට පුරා කම්කරුවන්ගේ සහයෝගය එයට ගලා ආවේය. වැටුප් කැපීමට එරෙහිව ඉන්දියානාපොලිස් මෝටර් කම්කරුවන් ගන්නා පියවරකට එයට ද වැඩි සහායක් ලැබෙනු ඇත.

ඉන්දියානාපොලිස් ජීඑම් කර්මාන්තශාලාව කම්කරුවන් විසින් වාඩි ලා ගැනීම මීට පෙර පරම්පරාවක මෝටර් රථ කම්කරුවන් විසින් තහවුරු කරන ලද අරගල සම්ප්‍රදාය යලි තහවුරු කිරීමක් වනු ඇත. එවැන්නක් මුලු රට පුරාම කම්කරුවන් තුල ප්‍රතිරාවය දෙනු ඇත. ෆැක්ටරිය අත්පත් කරගැනීම ධනේශ්වර පාලනයේ පදනම වූ නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික අයිතිය ප්‍රශ්නයට භාජනය කෙරෙනු ඇත. එහෙයින්ම එවන් ක්‍රියාවක් මධ්‍යම ආන්ඩුවේ ද ප්‍රාන්ත හා ප්‍රාදේශීය මට්ටම්වල ද ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් දේශපාලකයන්ගේ දැඩි විරුද්ධත්වයට ලක්වනු ද ඇත.

කම්කරු පන්තිය අවුරුදු ගනනක් තිස්සේ දිනාගත් අයිතීන් විනාශ කර දමනු සඳහා ජීඑම් සහ ක්‍රයිස්ලර් සමාගම් බංකොලොත් බවට ඇද දැමූ ඔබාමා පාලනාධිකාරයට එරෙහි සෘජු අභියෝගයක් ලෙසය යහපත් වැටුප් සහිත අරගලය දැන් ඉදිරියට යන්නේ.

බංකොලොත් ලැබූ මෝටර් කර්මාන්තය යලිත් ලාභ ලබන කර්මාන්තයක් බවට පත් කරගැනීම ධනපති පන්තියට කරගත හැක්කේ 1920 ගනන්වල මහා අවපාතයෙන් පසු නුදුටු විරූ සූරා කෑමේ තත්වයන් අද දින කම්කරුවන් මත පැටවීම මගින් පමනකි.

කම්කරුවන්ගේ ජීවන තත්වයන් පමනක් නොව මුලු කම්කරු කන්ඩායම් ම විනාශයට පත් කොට ජෙනරල් මෝටර්ස් සමාගමේ කොටස් ඉදිරි මාසවල දී කොටස් වෙලඳපලට ප්‍රසිද්ධියේ දමනු ලබන විට එම කොටස් මිලදී ගැනීම තුලින් මහා ලාභ පොදි ගසා ගැනීමටය වෝල් වීදිය සැරසී සිටින්නේ.

කම්කරුවන් මෙය තුලින් අත්‍යවශ්‍ය දේශපාලන නිගමනය උකහා ගතයුතු යඃ එම තීන්දුව නම් ධනපතීන්ගේ ලාභ ගරන පද්ධතිය ම අභියෝගයට ලක් කල යුතු බවය. මූලික නිෂ්පාදන බලවේගයන් ද මහා බැංකු හා මූල්‍ය ආයතනයන් ද පුද්ගලික ලාභයේ උල්පත් ලෙස ධනපතියන් අත තවදුරටත් තැබිය නොහැකිය. කර්මාන්ත ශාලාවල් ජනසතු කොට වැඩකරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර පාලනය යටතේ පොදු සංස්ථාවන් බවට පත් කල යුතුය. මෙයින් ඉල්ලා සිටින්නේ මහ ධනපති පන්තියේ දේශපාලන පක්ෂයන්ගෙන් කැඩී කම්කරුවන්ගේ ආන්ඩුවක් සඳහා සටන් කිරීම සඳහා කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය පිහිටුවා ලීම වේ.

සියලුම කම්කරුවන් ඉන්දියානාපොලිස් කම්කරුවන්ගේ අරගලයට සහාය දිය යුතු යයි ද ලාභ ගරන ධනපති ක්‍රමයට එරෙහිව සමස්ත කම්කරු පන්තිය බලමුලුගැන්වීමේ ආරම්භක ලක්ෂ්‍යය ලෙස මෙය ගතයුතු යයි ද සමාජවාදී සමානතා පක්ෂය කියා සිටී.

© www.wsws.org